# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අධ්‍යයන පුරප්පාඩු

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.09.17** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **බෞද්ධ අධ්‍යයන පීඨය**

**01. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු**

I. බෞද්ධ සංස්කෘතිය
II. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය

**02. කථිකාචාර්ය (තාවකාලික) තනතුරු**

III. බෞද්ධ සංස්කෘතිය
IV. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය

**03. පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය**

- භාෂා අධ්‍යයන පීඨය

**04. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු**

I. පාලි
II. සිංහල
III. දෙමළ භාෂාව
IV. කොරියන් භාෂාව

**05.** <u>කථිකාචාර්ය (තාවකාලික) තනතුරුඃ</u>

V. ඉංග්‍රීසි
VI. ජපන් භාෂාව
VII. ප්‍රංශ භාෂාව

* (අදාළ අයදුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීමට හැකියාව තිබිය යුතුය.)

සටහන

*** කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගනු ලබන්නන් පළමු පත්වීම් දිනයේ සිට වසර 05ක් (පහක්) සඳහා වූ අඛණ්ඩ සේවාවක් පවත්වන බවට විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතු ය.**

**(I)** වැටුප් පරිමාණය

| | | |
|---|---|---|
| ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) | - U-AC 3(I) | - රු. 160,520-7x3,900-187,820 (මාසික) |
| ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | -U-AC 3(II) | - රු. 138,980-11x2,940-171,320 (මාසික) |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) | - U-AC 3(III) | - රු. 121,340-5x2,940-136,040 (මාසික) |
| කථිකාචාර්ය (ආධුනික) | - U-AC 3(IV) | - රු. 94,400-10x2,400-118,400 (මාසික) |
| පරිගණක උපදේශක (II ශ්‍රේණිය) | -U-AS 2 (II) | - රු.85,305-3x2,400-92,505 (EB) 94,905 – 14 x 2,400 – 128,505 (මාසික) |

* ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛානුකූලව හිමි අනෙකුත් දීමනා සඳහා හිමිකම් ඇත.

කථිකාචාර්ය (තාවකාලික) - U-AC 2 - රු.85,305/- (මාසික)

ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ

❖ තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15%ක මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3%ක මුදලක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

❖ පාරිතෝෂික දීමනාව

**අනෙකුත් ප්‍රතිලාභ**

- ❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව හිමි අනෙකුත් දීමනා
- ❖ විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය :**

**සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් 2025.09.10** දින දක්වා මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) කාර්යාලයට පෞද්ගලික ව පැමිණීමෙන් හෝ තම නම, ලිපිනය ලියූ මුද්දර ගැසූ (රු. 120.00) ලිපි කවරයක් (සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ) මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) වෙත එවීමෙන් (කවරයේ ඉහළ වම් කෙළවරෙහි අදාළ තනතුර සඳහන් කළ යුතුය) නැතහොත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත කළ හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිතව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර **2025.09.17** දින හෝ ඊට පෙර ''ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,නො. 37, මොරගහහේන පාර, පිට්පන නගරය, හෝමාගම." යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ පිටපතක් ලිපි කවරයේ අමුණා එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ලේඛකාධිකාරී (වැඩබලන)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
නො. 37, මොරගහහේන පාර,
පිට්පන නගරය,
හෝමාගම.
2025.08.17.